# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2041/26 - 2017 ඔක්තෝබර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2017.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* 2/2/1/129.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2014/WS/226.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 239A, රතුපස්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගල්ලොලුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක ගම් 3998 හා 2017.04.24 දිනැති පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1537 ක් වූ මිල්ලගහවත්ත නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

*උතුරට:* මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ආර්. පී. වික්‍රමාරච්චි හිමිකම් කියන දෙල්ගහවත්ත,
*නැගෙනහිරට:* ආර්. පී. වික්‍රමාරච්චි හිමිකම් කියන දෙල්ගහවත්ත සහ මු.පි. අංක 3231 හා කැබලි අංක 01,
*දකුණට:* මු. පි. කො. 3231 හි කැබලි අංක 01 සහ බී. ඩබ්ලිව්. පියසේන හිමිකම් කියන මිල්ලගහවත්ත,
*බටහිරට:* බී. ඩබ්ලිව්. පියසේන හිමිකම් කියන මිල්ලගහවත්ත, පාර සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 දෙසැම්බර් මස 20 වැනි දින පෙ. ව. 10.00 ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 දෙසැම්බර් මස 06 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු හා අනිකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය.

සී. පී. ඩබ්ලිව්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2017 ඔක්තෝබර් මස 16 වැනි දින,
ගම්පහ,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11 - 223


1A - G 26446 - 17 - (2017/10)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම් යොමු අංකය*: 6/3/7/15/12/5/38.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: LD/05/2007/MV/157G.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ 1956/3 හා 2016.02.29 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ වූ ග.පි. 531, අතිරේක අංක 31, පත්‍ර 31 දරන සැලැස්මට අයත් කැබලි අංක 1007 හි ප්‍රමාණය හෙක්ටයාර් 0.1081ක් ලෙස සඳහන් වුව ද, එය අත්පත් මූලික පිඹුරට අනුව හෙක්ටයාර් 0.0181 යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආත්මා දිලුක්ෂි ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2017 ඔක්තෝබර් මස 11 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

11-224